# නිවේදනයයි

## 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත

ඉහත පනත යටතේ මෙම ආයතනයට අදාළ තොරතුරු ලබා ගැනීම සඳහා පහත සඳහන් තොරතුරු නිලධාරියා වෙත RTI 01 දරණ අයදුම් පත්‍රය මඟින් අයදුම් කළ හැකිය. මෙම අයදුම් පත්‍රය ඉදිරිපත් කිරීම අනිවාර්ය නොවේ.

**තොරතුරු නිලධාරියා**

| | | |
|---|---|---|
| නම | - | ජී. එම්. මංජරිකා සුජීවා |
| තනතුර | - | සහකාර නීති නිලධාරී |
| ආයතනයේ ලිපිනය | - | නිමාව, කොලොන්නාව |
| දුරකතන අංකය | - | 011-2193311 |
| විද්‍යුත් තැපැල් ලිපිනය | - | sujeewap@cpstl.lk |

01. තොරතුරු ලබා ගැනීමට ලිඛිත RTI 01 අයදුම්පත්‍රය හෝ ලිපියක් හෝ වාචික ඉල්ලීමක් තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කර එය ලැබුණු බවට ලිපියක් ලබා ගන්න.

02. ඔබේ ඉල්ලීමට අදාළ තොරතුරු සැපයිය හැකිද යන්න පිළිබඳව හැකි ඉක්මණින්, කෙසේ වුවද දින 14 ක් තුළ දක්වනු ලැබේ.

03. තොරතුරු ලබාගැනීමට ගෙවීමක් කල යුතුනම් ඒ අනුව ගාස්තු ගෙවීම මත හෝ ගාස්තු ගෙවිය යුතු නොවේ නම් ගාස්තු රහිතව ඔබට දින 14ක් තුළ තොරතුරු ලබාදෙනු ඇත.

04. ගාස්තු ගෙවීමෙන් පසු දින 14ක් තුළ තොරතුරු ලබාදීම අපහසු වේනම් තොරතුරු නිලධාරියා විසින් එකී කාලය දීර්ඝ කිරීමට අවශ්‍ය හේතු සඳහන් කරමින් දින 21ට නොවැඩි අතිරේක කාලයක් තුළ ඔබ ඉල්ලා සිටි තොරතුරු ඔබට ලබා දෙනු ඇත.

05. තොරතුරු ලබා ගැනීම සඳහා වන ඉල්ලීම යම් පුරවැසියකුගේ ජීවිතය සහ පුද්ගලික නිදහස සම්බන්ධයෙන් වන අවස්ථාවක ඉල්ලීම සඳහා ප්‍රතිචාර දැක්වීම, ඉල්ලීම ලැබී පැය 48 ක් තුළ සිදු කරනු ඇත.

## 06. තොරතුරු ලබා ගැනීම සඳහා කරන ලද ඉල්ලීමකට අදාළව

(I) තොරතුරු ඉල්ලීම සඳහා කරන ලද යම් ඉල්ලීමක් භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම,

(ii) පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රදානය කිරීමෙන් මුක්ත කර ඇති තොරතුරු හේතුවෙන් යම් තොරතුරක් වෙත ප්‍රවේශ වීම සඳහා අවස්ථාව ලබාදීම ප්‍රතික්ෂේප කිරීම,

(iii) පනත මඟින් නිශ්චිතවම දක්වා ඇති කාලසීමාවන්ට අනුකූල නොවීම,

(iv) සම්පූර්ණ නොවූ, නොමග යවන හෝ සාවද්‍ය තොරතුරු ප්‍රදානය කිරීම,

(v) වැඩිපුර ගාස්තු අයකිරීම,

(vi) ඉල්ලා සිටිනු ලබන ආකෘතියෙන් තොරතුරු සැපයීමට තොරතුරු නිලධාරියා විසින් ප්‍රතික්ෂේප කිරීම,

(vii) එම තොරතුරු වෙත එම පුරවැසියා ප්‍රවේශවීම වැළැක්වීම සඳහා එම තොරතුරු විකෘතිකර, විනාශ කර හෝ අස්ථානගත කර ඇති බවට තොරතුරු ඉල්ලා සිටිනු ලබන පුරවැසියා හට සාධාරණ හේතු පැවතීම, මත අතෘප්තියට පත්වන්නේ නම් පහත සඳහන් නම් කල නිලධාරියා වෙත දින 14ක් තුල අභියාචනයක් ඉදිරිපත් කරන්න.

**නම් කළ නිලධාරියා,**

| | |
|---|---|
| **නම** | - පී.ඩී.පී. ධර්මවංශ |
| **තනතුර** | - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පාලන |
| **ආයතනයේ ලිපිනය** | - නිමාව, කොලොන්නාව |
| **දුරකතන අංකය** | - 011 - 2531326 |
| **විද්‍යුත් තැපැල් ලිපිනය** | - darmawansa@cpstl.lk |